කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
**University of Kelaniya - Sri Lanka**

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
*Centre for Distance and Continuing Education*

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021
**Bachelor of Arts (General) Degree Second Examination (External) - 2021**

2024 අගෝස්තු
**August 2024**

මානවශාස්ත්‍ර පීඨය
**Faculty of Humanities**

වාග්විද්‍යාව
**Linguistics**

**LING 28214**
ශබ්දිම විචාරය, පදිම විචාරය සහ වාග්විද්‍යා ඉතිහාසය

ප්‍රශ්න සංඛ්‍යාව : 12 — කාලය : පැය 03.00යි

**No of Questions : 12** — **Time : 03.00 Hours**

එක් කොටසකින් යටත් පිරිසෙයින් ප්‍රශ්න එක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

පළමු කොටස - ශබ්දිම විචාරය

01. ශබ්දිම යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කොට ශබ්දිමය භාෂා ශබ්දයෙන් වෙනස්වන්නේ කෙසේදැයි උදාහරණ දෙමින් විමසන්න.

02. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

i. අනුපූරක විස්තෘතිය

ii. වෛකල්පික විස්තෘතිය

iii. රටා සමමිතිය

iv. ලාඝවතාව

*(අ. පි. බ. / P. T. O)*

03. ශබ්දිම විග්‍රහයේදී මතුවන ගැටලු මොනවාදැයි විග්‍රහ කරන්න.

04. පහත දැක්වෙන භාෂා දත්තවල [ s ],[ ʃ ] සහ [ ʂ ] ශබ්ද පිළිබඳ ශබ්දිම විග්‍රහයක් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | akaʃ | 'sky' | 11. | sthan | 'place' |
| 2. | aste | 'slow' | 12. | ʃastro | 'study' |
| 3. | aʃin | 'sat' | 13. | ʃƆkƆl | 'all' |
| 4. | bhaʃa | 'language' | 14. | aʃa | 'that' |
| 5. | hƆsto | 'hand' | 15. | beʃi | 'extra' |
| 6. | miʂʈi | 'sweets' | 16. | bhisti | 'boul' |
| 7. | osthi | 'seeds' | 17. | ceʂʈa | 'effort' |
| 8. | proʃƆstƆ | 'accepted' | 18. | driʂʈi | 'visual' |
| 9. | rƆs | 'juice' | 19. | maʃ | 'month' |
| 10. | sri | 'luck' | 20. | mƆstƆ | 'big' |

## දෙවන කොටස - පදිම විචාරය

05. පදිම, පදක සහ පදාණු නිර්වචනය කොට මේවා අතර ඇති සම්බන්ධතාව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

06. පදිම වර්ගීකරණය කළ හැකි ආකාරය අභිමත භාෂා දෙකකින් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

07. පදාණු නිගමනය කිරීමේ නිර්ණායක දක්වා ශබ්දිම නිගමිත පදාණු අභිමත භාෂා දෙකකින් නිදසුන් සපයමින් විස්තර කරන්න.

08. පදසාධන විධි හතරක් (04) නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

*(අ. පි. බ. / P. T. O)*

## තෙවන කොටස - වාග්විද්‍යා ඉතිහාසය

09. ''භාරතීය වාග්විද්‍යා ඉතිහාසය ආරම්භ වූයේ ආගමික පසුබිමකිනි.'' නිදසුන් දෙමින් විමර්ශනය කරන්න.

10. ග්‍රීසියේ සිදුවූ භාෂා අධ්‍යයන නූතන වාග්විද්‍යාවේ සංවර්ධනයට හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

11. ''ශාස්ත්‍රීය පුනර්ජීවන යුගයේ දී වාග්විද්‍යා අධ්‍යයනවල විෂය ක්ෂේත්‍රය පුළුල් විය.'' විමසන්න.

12. සොසුර්යෝගේ භාෂා සංකල්ප නූතන වාග්විද්‍යාවේ දියුණුවට හේතු වූ අයුරු පැහැදිලි කරන්න.

*(LING 28214_2021_03Pgs)*